# කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
# දැන්වීමයි

2019 හා 2021 අධ්‍යයන වර්ෂවලට අදාළව ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි, ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි හා වාණිජවිද්‍යාවේදී (විශේෂ) උපාධි යන පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වූ සිසුන් වෙත ශිෂ්‍ය හැඳුනුම්පත, ඉගෙනුම් කළමනාකරණ පද්ධතියට (LMS) අදාළ පරිශීලක නාමය (user name) හා මුරපදය (password) මේවන විට තමන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කර ඇත.

මෙතෙක් අදාළ තොරතුරු ලැබී නොමැති සිසුන් වෙතොත් තම නම, අයදුම්පත් අංකය, ජාතික හැඳුනුම්පත් අංකය හා දුරකථන අංකය **2023 මාර්තු 24** දිනට පෙර cdce@kln.ac.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කරන ලෙස මෙයින් දන්වමි.

තවද ඉගෙනුම් කළමනාකරණ පද්ධතියට (LMS) අදාළව තමන් වෙත ලබා දී ඇති පරිශීලක නාමය (user name) හා මුරපදය (password) වෙනත් බාහිර පාර්ශවයන් වෙත ලබාදීම සපුරා තහනම් වන අතර එසේ ලබාදීම විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට හේතුවන බව වැඩිදුරටත් දන්වමි.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය,
කැලණිය විශ්වවිද්‍යාලය,
2023.03.10